**I- කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1-(i) | 2-(iv) | 3-(iv) | 4-(i) | 5-(i) | 6-(iv) | 7-(iii) | 8-(iv) | 9-(i) | 10-(ii) |
| 11-(ii) | 12-(iii) | 13-(ii) | 14-(i) | 15-(iii) | 16-(iii) | 17-(i) | 18-(i) | 19-(iv) | 20-(iii) |
| 21-(i) | 22-(iv) | 23-(ii) | 24-(iii) | 25-(ii) | 26-(ii) | 27-(iii) | 28-(iv) | 29-(i) | 30-(iii) |
| 31-(iv) | 32-(ii) | 33-(iv) | 34-(iii) | 35-(i) | 36-(iii) | 37-(iv) | 38-(i) | 39-(iii) | 40-(i) |

**II පත්‍රය**

01.

(i) අත්තකිලමථානුයෝගය හා කාම සුඛල්ලිකානුයෝගය හෝ මෙහි සරළ අර්ථ
(ii) සමථ භාවනාව, විපස්සනා භාවනාව/ සමාධි භාවනාව, ප්‍රඥා භාවනාව/ චිත්ත භාවනාව, ත්‍රිලක්ෂණ භාවනාව
(iii) කාලය, දීපය, දේශය, කුළය, මව
(iv) නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතා නූන සෝ පිතා
    a. නිබ්බුතා නූන සා නාරී - යස්සායං ඊදි සෝ පතී
(v) බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය
(vi) සම්මුතිසත්‍යාවබෝධය හා පරමාර්ථසත්‍යාවබෝධය
(vii) "උඩගු නොව මහණ"
(viii) වැරදි දෙයින් වැළකීම විරමණයයි.
(ix) මෙත්තා,කරුණා, මුදිතා, උපේක්ෂා
(x) සැප, දුක්, මැදිහත්

02.

(i) උපන් විගස පියවර තැබීම, අභීත සිංහ නාද පැවැත්වීම, සිරිපා පිළිගැනීමට සත් පියුම් පිපීම.
(ii) මැනවින් ඉගෙනීම, ගුරු ගෞරවය, කීකරු කම, උගන්වන දෑ හොඳින් මතක තබා ගැනීම, මෙත් සිතුවිලි වලින් යුක්ත බව යනාදී කරුණු හෝ උචිත පිළිතුරු සලකා බලන්න.
(iii) බෝසත් අවධියේ මුහුණ දීමට සිදු වූ අභියෝග 03ක් වත් විස්තර කළ පිළිතුරු වලට උපරිම ලකුණු දෙන්න.(කුඩා අවධියේ හොඳින් ඉගෙනීම, ශිල්ප දැක්වීම, විවාහයට උචිත කුල කුමරියක් තෝරා ගැනීම, ගිහිගෙයින් නික්ම යාම, යනාදී කරුණු ආශ්‍රිතව පිළිතුරු ලිවිය යුතුය.)

03.

(i) තෙරුවන් ගුණ දැන ඇති කර ගන්නා පැහැදීම ශ්‍රද්ධාවයි.
(ii) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤූහීති.
(iii) පංච ශීලය, අජීව අෂ්ටමක ශීලය, කුමර කුමරි බඹසර රැකීම, මව් පියන්ට ගුරුවරුන්ට වැඩිහිටියන්ට කීකරු වීම, දෛනිකව තෙරුවන් නැමදීම, පෝ දින අටසිල් සමාදානය, කුඩා හෝ වරදක් සිදු නොකිරීම යනාදී පිළිතුරු වලට උපරිම ලකුණු දෙන්න.

04.

(i) උට්ඨානවතෝ සතිමතෝ
(ii) සුචිකම්මස්ස නිසම්ම කාරිනෝ
(iii) සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ
(iv) අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

(v) උත්සාහය, මනා සිහිය, පිරිසිදුව ක්‍රියා කිරීම, නුවණින් විමසා බලා ක්‍රියා කිරීම, දමනය වීම, දැහැමිව ජීවත් වීම, අප්‍රමාදය මෙම කරුණු වලින් 3ක් පාලියෙන් ලියා තිබුණද ලකුණු දෙන්න.

(vi) ඉහත ගාථාවේ සඳහන් කරුණු ඇතුළත් කරගෙන ලියා ඇති පිළිතුරු වලට ලකුණු දෙන්න.

05.

(i) දුක්ඛ ආර්ය සත්‍ය ,දුක්ඛ සමුදය ආර්ය සත්‍යය ,දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය,දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍ය/ දුක, දුකට හේතුව,දුක නැතිකිරීම,දුක නැති කිරීමේ මාර්ගය.

(ii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

(iii) දෛනික ජීවිතයේ අප මුහුණ දෙන ඕනෑම ගැටළුවක් චතුරාර්ය සත්‍ය ධර්මය අනුව විසඳා ගත හැකිය. මේ අනුව ඕනෑම ගැටළුවක ව්‍යුහය බැලූවිට එය කරුණු හතරක් ඔස්සේ සලකා බලා විසඳිය හැකි බව පැහැදිලි වේ. ගැටළුව, ගැටළුවට හේතුව, ගැටළුව විසඳීම, ගැටළුව විසඳීමේ මාර්ගය යන ආකාරය අනුව ගැටළුව විසඳිය හැකිය.(මෙසේ පාසල් සිසුන් ඇතුළු බොහෝ දෙනෙකුට මුහුණ දීමට සිදුවන ගැටළු විසඳිය හැකි ආකාරය විස්තර කර ඇත්නම් උපරිම ලකුණු දෙන්න)

06.

(i) නැගෙනහිර,දකුණ,බටහිර,උතුර,යට,උඩ

(ii) මවුපියන් පෝෂණය කිරීම, ඔවුන්ගේ කටයුතු සොයා බලා ඉටු කර ගැනීම. දෙමාපියන් ගෙන ආ කුළ පරපුර හා සිරිත් විරිත් ආරක්ෂා කර ගැනීම. දෙමාපියන් දුන් දායාද රැක ගැනීම. මවුපියන් පරලොව ගිය පසු පිං අනුමෝදන් කරවීම.(මින් කරුණු 3ක් ලියා තිබීම ප්‍රමාණවත්ය)

(iii) සිගාලෝවාද සූත්‍රය අනුව පළමුව දක්වා ඇති ඇති දිශාව වන්නේ නැගෙනහිර දිශාවයි. එම දිශාවට දෙමාපියන් හා දූදරුවන් යන කණ්ඩායම් දෙක අයත් වේ. බුදු රජාණන් වහන්සේ පෙන්වා දුන් පරිදි දරුවන් දෙමාපියන්ට යුතුකම් පහක් ද දෙමාපියන් දරුවන්ට යුතුකම් පහක් ද ඉටු කළ යුතුය. මෙම කරුණු ඒ ඒ පාර්ශව විසින් අනෙක් පාර්ශවයට මනා සේ ඉටු කරයි නම් කණ්ඩායම් දෙක අතර මනා සුහදතාවයක් ගොඩ නැගේ එවිට දෙපාර්ශවය අතරම සාමය, සමගිය,මිත්‍රත්වය ආරක්ෂා වේ. වත්මන් සමාජයේ දක්නට ලැබෙන දෙමාපියන්ට නොසලකන, ඔවුන්ට හිරිහැර කරන පිරිස් සමාජය තුළ දක්නට නොලැබෙයි. ඒ අනුව දෙපාර්ශවයම සතුටින් ජීවත් වේ. (මෙම කරුණු හෝ උචිත කරුණු ආශ්‍රිත පිළිතුරු වලට අදාළ පරිදි ලකුණු දෙන්න.)

07

(i) <u>දුටු ගැමුණු මහ රජතුමා</u>

දුටු ගැමුණු මහ රජතුමා රුහුණු රජ පෙළපතට අයත් කාවන් තිස්ස රජුගේ සහ විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයාය. “මාගේ මේ ව්‍යායාමය බුද්ධ සාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කළෙකත් රජ සැප පිණිස නොවේ.” යන්න දුටු ගැමුණු රජතුමාගේ අභීත සටන් පාඨය විය. විදේශීය පාලකයන්ගෙන් රටත් සම්බුද්ධ සාසනයත් බේරා ගැනීම එතුමාගේ එකම අභිලාශය වුණි.

එළාර නම් විදේශීය පාලකයාගෙන් රට මුදාගෙන රට එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා අනුව රට පාළනය කළේය. රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය යන නිර්මාණ සිදු කළ රජතුමා රටේ කෘෂි කර්මාන්තයද දියුණු කළ ජනතාවාදී පාලකයෙකි.

(ii) <u>පංච නීවරණ</u>

සිත කිළිටි කරන, කුසල් සිත් වලට බාධා කරන සිතිවිලි නීවරණ නම් වේ. එම නීවරණ 05කි. කාමච්ඡන්දය,ව්‍යාපාදය,ථිනමිද්ධ උද්දච්ච කුක්කුච්ච, විචිකිච්ඡාව යන කරුණු පහ නීවරණ නම් වේ. මෙම නීවරණ ධර්ම සිත තුළ පවතින ආකාරය උපමා පහකින් දක්වා ඇත.

(iii) <u>මනෝ කම්ම</u>

මනස මුල් වී කරන ක්‍රියා මනෝ ක්‍රියා නම් වේ. මෙම මනෝ කර්ම 3 කි. අභිධ්‍යාව හෙවත් දැඩි ලෝභය, ව්‍යාපාදය හෙවත් තරහව හා මිත්‍යා දෘෂ්ටිය හෙවත් වැරදි දැකීම එම කරුණු තුනයි. දස අකුසල් කර්ම වලින් තුනක් වශයෙන් මනෝ කර්ම සැලකේ.

(iv) <u>අරහං බුදු ගුණය</u>

බුදු ගුණ පාඨයේ සඳහන් වන බුදු ගුණ වලින් පළමු වැන්න ‘අරහං’ ගුණයයි. බුදු රජාණන් වහන්සේ රහසින් වත් පව් නොකළ නිසාත් සියළු කෙලෙස් ප්‍රහීණ කළ නිසාත් සියළු පූජාවන් ලැබීමට සුදුසු වූ නිසාත් ‘අරහං’ නම් වේ.